**ජනදිරිය අරමුදල - 2013**

------------------------------

ජනදිරිය අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඇවර කිරීමේ ගිණුම්, 2009 අංක 68 දරන ග්‍රාමෝදය මණ්ඩල අරමුදල (සංශෝධන) පනත මගින් සංශෝධිත 1982 අංක 28 දරන ග්‍රාමෝදය මණ්ඩල අරමුදල පනතේ 12(4)වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම ගිණුම් පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

ගිණුම්වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 ජනදිරිය අරමුදල විසුරුවා හැරීම**

---------------------------------

2013 ජනවාරි 03 දින ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජනදිරිය අරමුදල විසුරුවා හැරීම සඳහා වූ කටයුතු කිරීමට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ සාමාජිකයෙකුද ඇතුළත් ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුවේ නිර්දේශ පරිදි ඇවර කිරීමේ කටයුතු සිදුකර ගිණුම් පිළියෙල කර තිබුණි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1** **මතය**

**------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජනදිරිය අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2** **ජනදිරිය අරමුදලේ වත්කම් හා බැරකම් නිරවුල් කිරීම**

**-------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොඩනැගිලි, ලීබඩු හා උපකරණ, කාර්යාල උපකරණ සහ නේවාසික හා මුළුතැන්ගෙයි උපකරණ ගිණුම්වල 2013 ජනවාරි 01 දිනට එකතුව රු. 12,047,724 ක ශුද්ධ අගයක් පැවති අතර එම වත්කම් ඈවර කිරීමේ කමිටුව විසින් හඳුනා ගැනීමෙන් තොරව ඈවර කිරීමේ ගිණුමෙන් ලියා හැර තිබුණි.

(ආ) 2013 ජනවාරි 01 දිනට එකතුව රු. 337,447 ක් වූ ලැබිය යුතු කුලී, අගරු චෙක්පත්, ආරක්ෂක තැන්පතු, සුළු මුදල් අග්‍රිමය හා වෙනත් අත්තිකාරම් ගිණුම්වල පැවති ශේෂ ඈවර කිරීමේ කමිටුව විසින් උපලබ්ධි කරගැනීමෙන් තොරව ඈවර කිරීමේ ගිණුමෙන් ලියා හැර තිබුණි.

3. ඈවර කිරීමේ අලාභය

------------------------

ජනදිරිය අරමුදල ඈවර කිරීමේ රු. 12,378,084 ක් වූ අලාභය අරමුදලේ හිමිකම්වලට එරෙහිව ලියා හැර තිබූ අතර හිමිකම් ගිණුමෙහි රු. 165,806,672 ක ශේෂය ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර තිබුණි.